දුරකථන/தொலைபேசி இல./Telephone Nos.
අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832, 2784807, 2785617
ලේකම් / செயலாளர் / Secretary } 2784812
කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, Fax: 2784846
ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk
ඔබේ අංකය / உமது இல. / Your No. }

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாயா"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.
මගේ අංකය / எமது இல. / My No. } ED/05/68/12/පොදු
දිනය / திகதி / Date } 2017.06.07.11

චක්‍රලේඛ අංක:- **24 / 2017**

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
විද්‍යාපීඨ කොමසාරිස්,
සියලුම විදුහල්පතිවරුන්

අධ්‍යාපන ශික්ෂණවේදී ඩිප්ලෝමාධාරී ගුරු භවතුන් සඳහා ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ 16 වැනි වගන්තිය යටතේ රැකියා / අධ්‍යයන සඳහා වැටුප් රහිත විදේශ නිවාඩු ලබාදීම

අධ්‍යාපන ශික්ෂණවේදී ඩිප්ලෝමාධාරී ගුරු භවතුන් සඳහා වූ ගිවිසුම් ප්‍රකාරව වසර 05ක අනිවාර්ය සේවා කාලයකට යටත්ව සේවය කළ යුතු වේ.

02. ඒ අනුව ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 16 වැනි වගන්තිය යටතේ අධ්‍යයන/ රැකියා සඳහා විදේශ නිවාඩු ලබා ගැනීමේදී උක්ත ගුරු භවතුන්ට අනිවාර්ය සේවා කාලය සපිරෙන තෙක් සේවය කළ යුතුව ඇත.

03. එහෙත් සේවයේ ස්ථිර කරනු ලැබූ විද්‍යාපීඨ ගුරුවරුන් සඳහා පහත කොන්දේසි වලට යටත්ව ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ 16 වන වගන්තිය අනුව විදේශ අධ්‍යන/රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු ලබාදීමට හැකියාව ඇත.

3:1 අදාළ ගුරුවරයා සේවයේ ස්ථිර කර තිබිය යුතු අතර සේවයේ ස්ථිර නොකරන ලද ගුරුවරයෙකු සඳහා මෙම අනුග්‍රහය දිය හැකි වනුයේ අධ්‍යාපනය සඳහා පමණි.

3:2 ජාතික ශික්ෂණවේදී ඩිප්ලෝමා විද්‍යාපීඨ ගිවිසුම ප්‍රකාරව අදාළ ගුරුවරයා සම්පූර්ණ කළ යුතුව ඇති අනිවාර්ය සේවා කාලයට අනුපාතිකවන පරිදි ඇප මුදලක් නිවාඩු ඉල්ලුම් කරන දිනට තැන්පත් කළ යුතුය. මෙම කාලසීමාව ගණනය කිරීමේදී ආසන්න ලිත් මාසයට ගණනය කළ යුතුය.

3:3 විදේශ නිවාඩු අවසන්ව සේවයට වාර්තා කරනු ලබන ගුරුවරයාට, ඔහු පෙර සම්පූර්ණ කළ යුතුව තිබූ අනිවාර්ය සේවා කාලය සම්පූර්ණ කළ පසු, තැන්පත් කරනු ලැබූ ඇප මුදල ආපසු ලබා ගත හැකි අතර යම් හෙයකින් අනිවාර්ය සේවා කාලය සම්පූර්ණ කිරීමට ඔහු අපොහොසත් වුවහොත් ඇප මුදල ඒකාබද්ධ අරමුදලට බැර විය යුතුය.

3:4 මෙම චක්‍රලේඛයේ සිංහල දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එහිදී සිංහල භාෂා පාඨය බලපවත්වන්නේය.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය